ආරම්භය 1945-09-30 ලි.ප. අංකය:39/82

දෙහිවල,සුදර්ශන පාරේ,ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනයේ පිහිටි
දෙහිවල බෞද්ධෝදය සංගමය මඟින්, ධර්මදානය පිණිස සෑම පුර පසළොස්වක පොහොය දිනයක් පාසා නිකුත් කරන මාසික දහම් කලාපය.

# බෞද්ධෝදය

79 වර්ෂය - ශ්‍රී බු: ව 2569 2026 මාර්තු 02 මැදින් කළාපය

**ඓතිහාසික සිතුල්පව්ව රාජමහා විහාරය,**
**ඓතිහාසික යටගල රාජමහා විහාරය ප්‍රමුඛ අෂ්ඨ මහා විහාරාධිපති,**
**දක්ෂිණ ලංකාවේ සමථ බල සම්පන්න ප්‍රධාන අධිකරණ සංඝනායක**
**සද්ධර්ම කීර්ති ශ්‍රී රතනසාර,**
**කොළඹ නාලන්ද විද්‍යාලයේ හිටපු ධර්මාචාර්ය,**
**ශාස්ත්‍රපති, පූජ්‍ය, ලේල්වල සමිත ස්වාමීන්වහන්සේ**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

# “දුටුවොත් නිසි ලෙද - නිම වෙයි සසරද”

**“ද්වේ ඛෝ ආවුසෝ පච්චයා සම්මාදිට්ඨියා උප්පාදාය, පරතෝ ච ඝෝසෝ, යෝනිසෝ මනසිකාරෝ”**
**(මජ්ඣිම නිකාය, මහා වේදල්ල සූත්‍රය )**

සුපින්වතුනි,

“ඇවැත්නි, සම්මාදිට්ඨිය ඇතිවීමට පරතෝ ඝෝස, යෝනිසෝ මනසිකාර යන ප්‍රත්‍ය දෙක ප්‍රත්‍ය වේ” යනුවෙන් සාරිපුත්ත මහරහතන් වහන්සේ මහා කොට්ඨිත මහරහතන් වහන්සේ ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් දේශනා කළහ. මේ සම්මාදිට්ඨියට සීලයෙන්, ධර්මඥානයෙන්, ධර්ම සාකච්ඡාවෙන්, සමථ භාවනාවෙන්, විදර්ශනාවෙන් අනුග්‍රහ ලැබුණු විට චිත්ත විමුක්ති, ප්‍රඥා විමුක්ති යන ප්‍රතිඵල ලැබෙන බව සැරියුත් තෙරණුවෝ ඊළඟ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් වදාළහ. අටුවාවෙහි මෙම කාරණය උදාහරණයකින් පෙන්වා දී ඇත. අඹ ගසක් සිටුවා අඹ ගෙඩි අනුභව කිරීමට බලාපොරොත්තු වන තැනැත්තා අඹ පැළය සිටුවා එය වටා දිය රඳා සිටීම සඳහා දිය කොටුවක් තනයි. එමෙන් රහත් ඵලය බලාපොරොත්තු වන තැනැත්තා සිව් පිරිසිදු සීලයෙන් තමාගේ කය, වචනය, ඉන්ද්‍රිය ක්‍රියාකාරිත්වය, ජීවිතය රැකගැනීමට

අවශ්‍ය පහසුකම් සපයාගන්නා ක්‍රමය සංවර කර ගනී.

වරින් වර අඹ පැළයට වතුර වත් කරන්නාක් මෙන් වරින් වර ධර්ම ශ්‍රවණය කරයි. දිය කොටුවේ ඉවුර බිඳී යාමට නොදී රැක ගන්නාක් මෙන් විදර්ශනාවට මුල් වන සමථ භාවනාවෙහි යෙදෙයි. අඹ පැළය වටා හැදෙන වල් පැළ ගලවා දමන්නාක් මෙන් කමටහනෙහි ඇතිවන බාධක දුරු කරයි. අඹ පැළය වටා ඇති පස් තද වීම වැලක්වීමට වරින් වර සාරන ආයුධයකින් පස් බුරුල් කරන්නා සේ අනිච්ච, දුක්ඛ, අනත්ත, නිබ්බිදා, විරාග, නිරෝධ, පටිනිස්සග්ග යන අනුපස්සනා හත වඩමින් කෙලෙස්වල තද ගතිය දුරු කරයි. මේ සීලාදී කරුණු පහෙන් යුක්ත වූ සම්මාදිට්ඨිය රහත් බව නමැති අමා ඵලය ලබා ගැනීමට හේතු වෙයි.

නිවන් දැකීම සඳහා සම්මාදිට්ඨිය නැතුවම බැරි කාරණයක් බව මෙයින් ඔබට වැටහෙනු ඇත. සිංහල භාෂාවෙන් කියන්නේ නිවැරදි දැකීම" කියල ඒක අහන අය තම තමන් නිවැරදිව සිතන ආකාරය "සම්මාදිට්ඨිය" කියා තේරුම් ගත හොත් එය වැරදියි. බුදුරජාණන්වහන්සේ පෙන්වා දුන් ආකාරයට තමාගේ නුවණින් දැකීම තමයි 'සම්මාදිට්ඨි' කියන්නේ. නුපන් කුසල් ඉපදීමටත්, උපන් කුසල් වැඩිදියුණු වීමටත් සම්මාදිට්ඨි තරම් උපකාරවත් වන, වෙනත් ධර්මයක් නැතැයි අංගුත්තර නිකායේ ඒකධම්ම පාලියෙහි සඳහන් වේ. සම්මාදිට්ඨියෙහි කොටස් දෙකක් ඇත.

i. භව සම්පත් ලබාදෙන ලෞකික වූ, පුණ්‍ය පක්ෂයට ඇතුළත් වන, ආශ්‍රව සහිත වූ, දසවස්තුක සම්මා දිට්ඨිය හෙවත් කම්මස්සකතා සම්මාදිට්ඨිය පළමුවැන්නයි එනම්, තමා කළ කුසලාකුසල කර්මයන්ගේ විපාක තමා කරා එන බව, කර්මය දායාදයක් කොට, නැයකු කොට, පිළිසරණ කොට පවතින බව, එහි වගකීම තමන්ට පැවරෙන බව (දේවදූත සූත්‍රය බලන්න) පිළිගැනීමයි. තෙරුවන් සරණ ගිය බෞද්ධයන් මූලික වශයෙන් ඇති කර ගත යුත්තේ මෙයයි.

ii. ආශ්‍රව රහිත වූ, ලෝකෝත්තර වූ, නිවනට මග වූ සම්මා දිට්ඨිය දෙවැන්නයි. තමාගේ දැක්ම ඍජු වන්නේ මෙය ලබාගත් විටය. (උජුගතාස්ස දිට්ඨි) මජ්ඣිම නිකායේ සම්මාදිට්ඨි සූත්‍රයේදී මෙය සොළොස් ආකාරයකින් විස්තර කොට ඇත. එම සොළොස් ආකාරයෙන් ම පෙන්වා දෙන්නේ හේතු - ඵල වශයෙන් බැලීමේදී ඇතිවන තත්ත්වාකාර දැනීම ලෝකෝත්තර සම්මා දිට්ඨිය බවයි. මෙය පළමු වරට ඇති වන්නේ සෝවාන් මාර්ග සිතෙහිය. එබැවින් ඔහු "දිට්ඨි සම්පන්න" නම වේ.

මේ අයුරින් ලෝකෝත්තර සම්මා දිට්ඨිය ඇතිකර ගත් විට ඉතිරි මාර්ගාංග හත ද වැඩී සත්තිස් බෝධිපාක්ෂික ධර්මය සම්පූර්ණ වන ආකාරය මජ්ඣිම නිකායේ මහා චත්තාරීසක සූත්‍රයේ සඳහන් වේ. ආර්ය මාර්ගයෙහි ඉදිරියෙන් ගමන් කරන්නා සම්මාදිට්ඨිය බව සංයුක්ත නිකාය දේවතා සංයුක්ත, අච්ඡරා සූත්‍රයේ දක්වා ඇත.(සම්මා දිට්ඨි පුරේජවං)

සම්මාදිට්ඨිය ඇතිවීමට කරුණු දෙකක් හේතු වේ.

i පරතෝ ඝෝස :-

චතුරාර්ය සත්‍යය පැහැදිලි කරමින් කල්‍යාණ මිත්‍රයකු විසින් කරනු ලබන ධර්ම දේශනාවක් ඇසීමට අවස්ථාව ලැබීම පරතෝ ඝෝස නම් වේ. එසේ නැති නම් සූත්‍ර අභිධර්මය පිටක දෙක හෝ ධර්ම ධරයන් විසින් ලියා ඇති ධර්ම ග්‍රන්ථ කියවීම ද පරතෝ ඝෝසයට අයත් සේ ගත හැකිය. බුදුරජාණන් වහන්සේගේ දේශනා සූත්‍ර හා අභිධර්ම පිටකවලත්, ඒ අනුසාරයෙන් ධර්ම කරුණු පැහැදිලි කිරීම ධර්ම සංග්‍රහ ග්‍රන්ථවලත් ඇති නිසා ඒවා පරතෝ ඝෝසයට අයත් කිරීම සුදුසුය.

දීර්ඝ කාලයක් මේවා පරිශීලනය කරන විට ඔබට ක්‍රමයෙන් ධර්මය වැටහෙන්නට පටන් ගනී. කල්‍යාණ මිත්‍රයකුගේ ධර්ම දේශනා අසන විට ඒවා වඩ වඩාත් පැහැදිලි කර ගත හැකි වේ. මෙහිදී ඔබ කළ යුත්තේ හැකි තරම් දහම් කරුණු එක්රැස් කරමින් ධර්මය පිළිබඳව ශාස්ත්‍රීය දැනුමක් ලබාගැනීම නොව සසරින් ගැලවෙන තැන සොයා ගැනීමට ඔබේ නුවණ මෙහෙය වීමයි. කෙලෙස් ගැටය ලිහා ගැනීමට අවශ්‍ය නුවණ ඔබ තුළ පහළ වේ නම් එය ප්‍රමාණවත් ය.

ii යෝනිසෝ මනසිකාර:-

බණ අසන තැනැත්තා බණට කන් යොමු කිරීමෙන් පමණක් නො නැවතී. එය වටහා ගැනීමට නුවණ යොමු කළ යුතුයි. අද බණ අසන අය මිස නුවණ යොමු කරන අය නැත. නුවණ මෙහෙයවා අසන විට පෙර තමා අසා තිබූ කියවා තිබූ දහම් කරුණු වඩාත් හොඳින් පැහැදිලි වෙයි. යෝනිසෝ මනසිකාරය අවශ්‍ය වන්නේ එසේ තේරුම් ගැනීම සඳහාය. සැරියුත් මහරහතන් වහන්සේ සොළොස් ආකාරයකින් යෝනිසෝ මනසිකාරයෙහි යෙදිය යුතු සැටි මජ්ඣිම නිකායේ සම්මාදිට්ඨි සූත්‍රයේ පෙන්වා දුන්හ.

උදාහරණ වශයෙන් වර්තමාන අත්දැකීම වන ජරා මරණ සිට ආපස්සට හේතු ප්‍රත්‍ය සලකා බලන්නේ මෙසේය.

i කතමං ජරාමරණං ? (ජරා මරණ යනු කුමක්ද?)
ii කතමෝ ජරාමරණ සමුදයෝ? (ජරා මරණ හට ගන්නේ කෙසේද?)
iii කතමෝ ජරාමරණ නිරෝධෝ? (ජරා-මරණ නිරුද්ධ වීම යනු කුමක්ද?)
iv කතමා ජරාමරණ නිරෝධගාමිණී පටිපදා? (ජරා මරණ නිරුද්ධ වීමට හේතු වන ප්‍රතිපදාව කුමක්ද?

මේ ආකාරයට කුසලාකුසල කර්ම, චතුර්විධ ආහාර, චතුරාර්ය සත්‍යය, පටිච්ච සමුප්පාදයේ අංග දොළස, ආසුව යන කරුණු චතුරාර්ය සත්‍යය ආකෘතිය අනුව යෝනිසෝ මනසිකාරය (මුල පටන් මෙනෙහි කිරීම) මෙහෙයවා අවබෝධ කර ගත යුතු සැටි එහි විස්තර කොට ඇත. පටිච්චසමුප්පාද යනු බුදුදහමේ සිද්ධාන්තයයි. චතුරාර්ය සත්‍යය යනු එම සිද්ධාන්තය දේශනා කළයුතු සහ අවබෝධ කර ගත යුතු ක්‍රමවේදයයි. එම ක්‍රමවේදය ද හේතු - ඵල ධර්මතාව මත පිහිටා ඇති සැටි ඉහත උදාහරණයෙන් ඔබට වැටහෙනු ඇත.

යෝනිසෝ මනසිකාරය නොමැති නම් පරතෝ ඝෝසය තිබුණ ද ධර්මය අවබෝධ නොවේ. නාම - රූප ධර්මයන් තණ්හා, උපාදාන සමග සම්බන්ධ වී සළායතන මගින් ක්‍රියාත්මක වීම නිසා කර්ම නමැති ශක්තිය ඉපදී ජාති ආදී සංසාර ක්‍රියාවලිය සිදුවේ. මෙයින් මිදීමට අවශ්‍ය වන්නේ සළායතන ක්‍රියාකාරිත්වය පිරිසිඳ දැන, තණ්හා උපාදාන නමැති ඉන්ධන සැපයීම වැළැක්වීමයි. එවිට පඤ්ච උපාදානස්කන්ධ නාමැති එන්ජිම නවතී. යෝනිසෝ මනසිකාරය අවශ්‍ය වන්නේ මේ සත්‍යය නුවණින් අවබෝධ කර ගැනීමටයි.

මේ අයුරින් පරතෝ ඝෝසය හා යෝනිසෝ මනසිකාරය උපයෝගී කරගෙන සද්ධර්මය පළමු වරට අවබෝධ කළ තැනැත්තා සෝතාපන්න නම්වේ. හෙතෙම සතර අපායේ නුපදී. ආත්මභාව හතක් ඇතුළත ඉතිරි මාර්ග - ඵල අවබෝධ කරයි.

බෞද්ධයකු වූ ඔබ කළ යුත්තේ මේ උතුම් සෝතාපන්න තත්වයට වත් පත්වීමට උත්සාහ කිරීමයි. ඒ සඳහා ඔබට නුවණ පහළ වේවා!

ඔබ සැමට තෙරුවන් සරණයි!

ශාස්ත්‍රපති ලේල්වල සමිත හිමි.